18 වන පිටුවෙන් (මව්බිම මුහුණ පා ඇති )

සතුව තිබූ හෝටල් 22ක් විකුණා දමා ඇති අතර නුවර ක්වීන්ස් හෝටලය තෑග්ගක් ලෙස නොමිලේ ලබා දී ඇත. අපේ රටේ ඇති මහා සම්පතක් වන පුල්මුඩේ ඛනිජවැලි නිධිය ඕස්ට්‍රියානු සමාගමකට විකුණා දැමීමට සුදානම් වූ අතර එය නතර කිරීමට අධිකරණයේ පිහිට

පැතීමට ජනතා විමුක්ති පෙරමුණට සිදුවිය. ඒ අනුව ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන බිමල් රත්නායක හා ජයන්ත විජේසේකර යන සහෝදරවරු පුල්මුඩේ ඛනිජ වැලි නිධිය විකිණීමට එරෙහිව අධිකරණයේ ගොනුකළ පෙත්සම විභාග කිරීමට අධිකරණය තීරණය කර ඇත. එසේ අප මැදිහත් නොවුනේ නම් මේ සම්පත අපට අහිමි වී යනු ඇත. එපමණක් නොව අම්බලන්තොට ගොඩවායේ ඇති ඛනිජ වැලි නිධිය හා තිස්සමහාරාම කිරින්දේ ඇති ඛනිජ වැලි නිධිය ද ඉන්දියානු සමාගමකට විකුණා ඇති අතර ප්‍රදේශයේ මහජන විරුද්ධත්වය විසින් එය තාවකාලිකව නැවතී ඇත. ඒ රාජපක්ෂ ආණ්ඩුව රට විකුණන ප්‍රතිපත්තිය ක්‍රියාවට නගන ආකාරයයි.

අනෙක් අතට ජනතාව මත බර පැටවීම ද දැන් දිගටම කරමින් යයි. වයඹ මැතිවරණ ප්‍රතිඵල නිකුත් වන විටම මහා පරිමාණයෙන් ජල ගාස්තු වැඩි කළ ආණ්ඩුව දුරකථන සඳහා 10%ක අමතර බද්දක් පැනවීය. ඊට අමතරව නිෂ්පාදන හා මූල්‍ය බදු වර්ග 5ක් මෙම 25 වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගැනිනි. තව බදු රැසක් ඉදිරියේ දී පැනවීමට නියමිතව ඇති අතර සුප්‍රසිද්ධ මලප්‍රවාහන බද්ද හෙවත් වැසිකිළි බද්ද ද ඒ අතර වේ. මෙයින් පෙනී යන්නේ රට මුහුණ පා ඇති දැවැන්ත ආර්ථික අර්බුදයට මුහුණ දීමට ආණ්ඩුවට හැකියාවක් නැති බවත් ආර්ථික අර්බුදය හමුවේ ආණ්ඩුවරටටත්, ජනතාවටත් අහිතකර ක්‍රියාමාර්ග ගනිමින් යළි මූල්‍ය අරමුදලේ, ලෝක බැංකුවේ න්‍යාය පත්‍රයට වැටෙමින් තිබෙන බවයි.

රජයේ ආයතනවල සේවක පුරප්පාඩු නොපිරවීමට පසුගිය දා ආණ්ඩුව ගත් තීරණයත් මේ වසරේ රජයේ සේවකයන්ගේ වැටුප වැඩි නොකරන බවට ජනාධිපතිවරයාම කළ ප්‍රකාශයත් කියාපාන්නේ එයමය.

ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීමේ දී ද ආණ්ඩුව ජනවරමට පයින් ගසා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තියට මාරු වී තිබේ. කොටි ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරදා ආරක්ෂක හමුදා හා පොලීසිය ලබාගත් ජයග්‍රහණ උපයෝග කරගනිමින් ආණ්ඩුව කළයුතුව තිබෙන්නේ කුමක්ද? ඒ මුදාගත් ප්‍රදේශවල ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමත් ආර්ථික සංවර්ධන ඇති කොට, එහි ප්‍රතිලාභ ජනතාවට ලබා දී සියළු ජනතාවන්ට සමාන අවස්ථා ලබාදී ජාතික සමගිය ගොඩනැගීමය. විශේෂයෙන් පසුගිය දශක 2 කට වැඩි කලක් කොටි ත්‍රස්තවාදයේ ඒකාධිපතිත්වයට යටවී සිය දෙමළ ජනයාට ඔවුන්ගේ නිදහස හා අයිතීන් ලබාදීමත්ය. එහෙත් දැන් ආණ්ඩුව කරමින් සිටින්නේ ජනතාවට අයිතීන් දෙනවා වෙනුවට බෙදුම්වාදීන්ට කප්පම් දෙන වර්ගයේ කටයුතුය. ඒ අනුව උතුර හා නැගෙනහිර පලාත්වලට 13වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව උපරිම බලය ලබාදීමට ආණ්ඩුව සුදානම් වේ.

කොටි පරදන යුද්ධය ජයග්‍රාහී ලෙස ඉදිරියට යද්දීම පසුගිය කාලය පුරාම ලංකාවට බලපෑම් කළ ඉන්දියාවේ, එක්සත් ජනපදයේ, යුරෝපයේ, එක්සත් ජාතීන්ගේ නිලධාරීන්ගේ බලපෑමට ආණ්ඩුව යටවී ඇති බව පෙනේ. ආණුඩව මෙහිදී අනුගමනය කරන්නේ දෙබිඩි ප්‍රතිපත්තියකි. මැතිවරණ දිනා ගැනීම සඳහා මැතිවරණ වේදිකාවේ දේශප්‍රේමය හා යුද්ධයේ ජයග්‍රහණ අලෙවිකරණ' ආණ්ඩුව ජාත්‍යන්තර ප්‍රජාව හා බෙදුම්වාදීන් හමුවේ ඔවුන් සතුටු කිරීමට බලය බෙදීමේ කටයුතු අරඹා ඇත. ආණ්ඩුව බලය බෙදීමට ස්ථිරවම පියවර ගන්නා බවට ශාක්ෂි රැසක්ම තිබේ.

පසුගිය කාලය පුරාම විවිධ මාධ්‍ය සාකච්ඡාවල දී රජයේ ඇමතිවරු බලය බෙදන බවත්, 13වන ව්‍යවස්ථා සංශෝධනය එහි පදනම කර ගන්නා බවත් පැවසීම පසුගිය 2009 ජනවාරි මැද ජනාධිපතිවරයා අල්ජසීරා රූපවාහිනී සේවය සමග කළ සාකච්ඡාවේ දී බලය බෙදන බව පැවසීම 2009 ජනවාරි 27 රාත්‍රි හදිසියේ ලංකාවට පැමිණ පැය කිහිපයක් පමණක් ගතකොට ජනාධිපතිවරයා සමග විශේෂ සාකච්ඡාවක් පවත්වා දිවයිනෙන් පිටත්ව ගිය ඉන්දියානු විදේශ ඇමති මුඛර්ජි මහතා ජනමාධ්‍යවලට කළ ප්‍රකාශය, ඔහු පවසා

තිබුනේ උතුරට හා නැගෙනහිරට 13වන ව්‍යවස්ථා සංශෝධනයට ආණ්ඩුව බලය බෙදන බවටත්, 13වන ව්‍යවස්ථා සංශෝධනය ඉක්මවා ගිය බලය බෙදීමක් පිළිබඳව සොයා බලන බවටත් ජනාධිපතිවරයා තමන්ට සහතික වූ බවයි. තිස්ස විතාරණ මහතාගේ නායකත්වයෙන් යුත් සර්වපාක්ෂික නියෝජිත කමිටුව බලය බෙදීමේ සිය යෝජනා මාලාව සකසා අවසන් කිරීම. එමගින් ද 13වන සංශෝධනය ඉක්මවා ගිය බලය බෙදීමක් යෝජනා කර ඇත. පසුගිය දා 13වන සංශෝධනයට අනුව බලය බෙදීම අර්ථවත් කිරීම සඳහා ඇමති කමිටුවක් ගොඩනගා බලය බෙදීම වෙනුවෙන් කටයුතු ඇරඹීම, එකී කමිටුවේ සාමාජිකයන් වන්නේ රාජිත සේනාරත්න ඇමතිතුමා (කැඳවුම්කරු), ඩිලාන් පෙරේරා ඇමතිතුමා, තිස්ස විතාරණ ඇමතිතුමා, ඩිව් ගුණසේකර ඇමතිතුමා, ඩග්ලස් දේවානන්ද ඇමතිතුමා ය. ඊට අමතරව නැගෙනහිර මහ ඇමති පිල්ලයාන් හා බස්නාහිර හිටපු මහ ඇමති රෙජිනෝල්ඩ් කුරේ ද මෙහි සාමාජිකයන් වේ.

මේ සංවිධානයට කුප්‍රකට බෙදුම්වාදියෙක් වූ කුමාර් රූපසිංහ ද සහය ලබාදේ. මෙම කමිටුවේ සිටින රාජිත සේනාරත්න හා ඩිලාන් පෙරේරා මහත්වරු කුමාර් රූපසිංහ මහතා ද සමග එක්ව මීට කලකට පෙර යුද විරෝධී සංවිධානයක් අටවා යුධ විරෝධී පාගමක් ගොස් රැස්වීම් පැවැත්වූ ආකාරය අමතක කළ යුතු නැත. 2005 ජනවරමට පටහැනිව ගොඩනගා ඇති මෙම කමිටු අහෝසි කිරීමට ජනාධිපතිතුමා කිසිදු පියවරක් ගෙන නැත.

පසුගිය මාර්තු 9දා ලංකාදීප පුවත්පතට සාකච්ඡාවක් දුන් විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම මහතා බලය බෙදීම පිළිබඳව දී තිබූ ප්‍රකාශය, එම ප්‍රකාශය මගින් ජනාධිපතිවරයාගෙ හා ආණ්ඩුවේ අරමුණ ඉතාම නිරවුල්ව ඉදිරිපත් කර ඇති නිසා එම කොටස මෙසේ උපුටා දක්වමු. ත්‍රස්තවාදය පරදවා විසඳුම දෙන බව ආණ්ඩුවේ ස්ථාවරයයි. ඒකීය රටක් තුළ බලය බෙදා හැරීමත් ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි. ඉන්දු ලංකා ගිවිසුම හරහා ඇතිවූ පලාත් සභා හොඳ ආරම්භයක් ලෙස පිළිගන්නෙත් ඒකයි. පොලිස්, ඉඩම්, මූල්‍ය ආදී බලය බෙදීමකුත් කරනවාදැයි ඔබ අහනවා. සියළු බලතල ලබාදීම ආණ්ඩුවේ අරමුණයි. ඊට අවශ්‍ය කාලය, ව්‍යුවහය, පරිසරය ගැන සලකා බලන්නත් වෙනවා.පලාත් සභා අවසන් විසඳුම ද කියලත් ඔබ ඇහුවා. ජනාධිපතිතුමා කීවේ තර්ටීන් ප්ලස්' කියාය. ආණ්ඩුවේ හා ජනාධිපතිතුමාගේ අරමුණ මින් ඉතාම හොඳින් පැහැදිලි වේ. ජනතාව රැවටීමට ඒකීය ලංකාව යන වචනය යොදා ගනිමින් උපරිම ලෙස බලය බෙදාහැරීමට සුදානම් බවට තවත් ශාක්ෂි අවශ්‍ය නැත.

උතුර, නැගෙනහිර පලාත්වලට 13වන සංශෝධනයට අනුව පොලිස්, ඉඩම් හා මූල්‍ය බලය ලබාදීම යනු කුමක් ද? එය වෙනම රාජ්‍යයක ආරම්භය නොවේ ද? පසුගිය කාලයේ මෙරට ආරක්ෂක හමුදා හා පොලීසිය දහස් ගනන් දිවිපුදා, අතපය නැතිකරගෙන දිනාගත් ජයග්‍රහණ මේ හරහා අහෝසි නොවන්නේ ද? ආරක්ෂක හමුදා කොටි පරදා ලබාගත් එක් ජයග්‍රහණයක් වූයේ කොටින්ගේ නීති විරෝධී අවි බලය අහෝසි කිරීමය. එහෙත් ඒ වෙනුවට දැන් පලාත් සභා මගින් පොලිස් බලතල හරහා බෙදුම්වාදීන්ට නීත්‍යානුකූළ අවි බලයක් ලබාදීමට ආණ්ඩුව සුදානම් වේ. මෙය ඉතාම බරපතල තත්ත්වයක් නොවේ ද?

පසුගිය දා රුපියල් මිලයන 30ක කප්පම් ඉල්ලා ත්‍රිකුණාමලේදී පාසල් සිසුවියක් ඝාතනය කරනු ලැබූ අතර ඊට සැකපිට අත්අඩංගුවට ගනු ලැබුවේ නැගෙනහිර මහා ඇමතිගේ පක්ෂය ටී.එම්.වී.පී. පක්ෂයේ ප්‍රබල නායකයින් කිහිප දෙනෙකි. ලැබී ඇති තොරතුරු අනුව ඔවුන් මේ කප්පම් ඉල්ලා ඇත්තේ තම සංවිධානය සඳහා ගොඩනගන ගුවන්විදුලි නාලිකාවක් සඳහා අරමුදල් එකතු කිරීමටයි. මෙසේ අත්අඩංගුවට ගත් ටී.එම්.වී.පී. පක්ෂ නායකයින්ගෙන් එක් අයෙක් පොලිස් වෙඩි පහරින් මියගිය අතර එක් අයෙක් සයනයිඩ් කා මිය ගියේය. එහෙත් අවසානයේ සිදුවූයේ මෙම සිදුවීම ගැන පරීක්ෂණ පැවැත්වූ පොලිස් නිළධාරියා මාරුකර යැවීමට කටයුතු කිරීමය.

බෙදුම්වාදී පළාත් සභාවලට පොලිස් බලතල නැතුව තිබියදීත් තත්ත්වය මෙසේ නම් පොලිස් බලතල ලැබුණු විට තත්ත්වය කෙසේ වේද?

එසේම ඉඩම් බලතල දීම යනු ආරක්ෂක හමුදා සටන් කොට කොටි පරදා මුදාගත් භූමිය යලි බෙදුම්වාදීන්ට පැවරීමක් ද වේ. මේ අනුව බලය බෙදීම යනු මහා කැපකිරීම් හා දිවි පිදීම් හරහා ලබාගත් ජයග්‍රහණ සියල්ල යළි වෙනත් බෙදුම්වාදී කණ්ඩායමකට පැවරීම මිස අන් යමක් නොවේ. එවිට උතුර හා නැගෙනහිර ප්‍රදේශ ඉන්දියාවේ නිල නොවන ප්‍රාන්ත වනු ඇත.

ඔබ ද දන්නා පරිදි මේ වනවිට ඉන්දියාව උතුර නැගෙනහිර ප්‍රදේශවල ආර්ථික හා දේශපාලන බලය තහවුරු කරමින් සිටින අතර යුද බලය තහවුරු කිරීම ද අරඹා ඇත. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව 2007 සැප්තැම්බර් 30 දා අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් ත්‍රිකුණාමලය නගරයේ ව.කි.මීටර් 675ක භූමියක්, විශේෂ ආර්ථික කලාපයක් ලෙස නම්කර ඉන්දියාවට දී ඇත. සාම්පූර්වල විදුලිබලාගාරයක් හැදීමේ අයිතිය ද ඉන්දියාවට ලබාදී ඇත. උතුර ප්‍රදේශයේ කන්කසන්තුරේ සිමෙන්ති කම්හල හා හුනුගල් නිධිය ඉන්දියාවේ බිර්ලා සමාගමට ලබාදීමට ලබාදීමට කටයුතු කර ඇත. මන්නාරම් ද්‍රෝනියේ තෙල් සම්පත ගොඩගැනීම ද ඉන්දියාවට ලබාදී ඇත. ඒ උතුර හා නැගෙනහිර දේ පමණි.

ඊට අමතරව මේ වනවිට ඉන්දියාව මුල්මුඩේ රජයේ ඛනිජවැලි දෙපාර්තමේන්තුවට අයිති ගොඩනැගිල්ලක ඉන්දියානු හමුදා රෝහලක් ද පවත්වාගෙන යයි. ඒ ආණ්ඩුවේ ආරාධනය පරිදිය. එහි අරමුණ යුද ගැටුම්වලින් තුවාල ලබන දෙමළ ජනතාවට ප්‍රතිකාර කිරීමය. මෙම හමුදා රෝහලේ ඉන්දියානු වෛද්‍යවරු, හෙදියන් ඇතුළු 52ක් සේවය කරන අතර එය ලංකාවට වගකියන්නේ නැත. මෙය පෙනුමට රෝහලක් වුව ද මෙය කුඩා ඉන්දියානු හමුදා කඳවුරක් නොවේ යැයි කිව හැක්කේ කාට ද? මෙය ලංකාවේ ජාතික ආරක්ෂාවට ගැටළුවක් වන අතරම අපේ රටේ ගෞරවයට අවමන් කිරීමක්ද වේ. ගැටුම්වලින් තුවාල ලබන අපේම සහෝදර දෙමළ ජනයාට බෙහෙත් කිරීමටවත් අපේ රටට, අපේ හමුදාවට, අපේ වෛද්‍යවරුන්ට හැකියාවක් නැති බව මින් අනියමින් ප්‍රකාශ නොවන්නේ ද?

මේ සියල්ල දෙස අවධානයෙන් යුතුව බලන විට පෙනීයන්නේ කුමක් ද? ඒ උතුරේ යුද ජයග්‍රහනවලින් ජනතාව මෝහනයට පත්කොට ඒ මතින් බලය තහවුරු කරගන්නා ආණ්ඩුව ඊට යටින් බරපතල විනාශයක් වෙත අපේ මව්බිමත්, ජනතාවත් ඇදගෙන යන බවය. මෙය සරළ ප්‍රශ්නයක් නොවේ. මුලු රටකට ජනතාවකට අනාගතයේ වන්දි ගෙවීමට සිදුවන තරමේ මහා විපතකි. මෙම අනතුර වහාම පරාජය කළ යුතුය. පරාජය කළ හැකිය. මෙයට පෙර ද මව්බිමට එරෙහිව මතුවූ බරපතල

අනතුරු පරදා මව්බිමත්, ජනතාවත් රැකගැනීමට ජනතා විමුක්ති පෙරමුණට හැකි

විය. ඒ මෙරට දේශප්‍රේමී ජනයාගෙන් ලැබූ ආශිර්වාදය හා සහයෝගය මගිනි. අද ද

ඒ මැදිහත්වීම අවශ්‍යව තිබේ.

බෙදුම්වාදයට වාසි ගෙනදෙමින් 1999 දී චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පාර්ලිමේන්තුවට ගෙන ආ කලාප සභා ලබාදීමේ ව්‍යවස්ථාව (පැකේජය) පරාජය කිරීමට මුල්වූයේ ද, 2002දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කොටි සංවිධානය සමග අත්සන් කළ සටන්විරාම ගිවිසුම, එක්සත් ජාතික පක්ෂ පරදවා අහෝසි කිරීමට මග සකස් කළේ ද, 2005 දී චන්ද්‍රිකා මහත්මිය ගෙන ආ සුනාමි සහන මණ්ඩලයට එරෙහිව ඇමතිකම් 4ක් අත්හැර ආණ්ඩුවෙන් එළියට බැස අධිකරණයට ගොස් එය පරාජය කළේ ද උතුර පලාතෙන් නැගෙනහිර පලාත වෙන්කර ඇත්තේ ද ජනතා විමුක්ති පෙරමුණ විසිනි. එසේම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු සමයේ යළි පුබුදමු ශ්‍රී ලංකා හරහාත් ඊට පෙර පොදු පෙරමුණු සමයේත්, විකිණීමට ගිය රාජ්‍ය බැංකු, ජල සම්පත, කුඹුරු, වන සම්පත, දුම්රිය දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන, තෙල් සංස්ථාවේ කොටස්, විකිණීමට නොදී රැකගත්තේ ද ජනතා විමුක්ති පෙරමුණය.

අප ඉදිරියේ ඇත්තේ බරපතල අභියෝග රැසක් බව සැබෑය. එහෙත් ඒවා විසඳිය හැක. මතුවී ඇති ආර්ථික අර්බුදයට විසඳුම වන්නේ යළි රට විකිණීමේ ප්‍රතිපත්තියට යාම නොව ජනතා ආර්ථික උපාය මාර්ගය වෙත යාමය. ඒ සඳහා වූ පැහැදිලි දැක්මක් සහිත වැඩපිළිවෙලක් අප සතුව තිබේ. එසේම දූෂණ, හොරකම නවතා රටතුළ විනය හා යහපාලනය ස්ථාපිත කළයුතුය.

අනෙක් අතට අපේ ආරක්ෂක හමුදා විසින් කොටි ත්‍රස්තවාදය පරදවා ලබාගත් ජයග්‍රහණයන් පාවා නොදී ඒකීය ලංකාව තුළ සැබෑ ජාතික සමගිය ගොඩනැගීමට කටයුතු කළ යුතුය.

මෙසේ සමාජ, ආර්ථික, දේශපාලන අභියෝග ජයගැනීම සඳහා වූ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙලසහිත පළල් දේශප්‍රේමී මධ්‍යස්ථානයක් හෙට දවසේ අප විසින් ගොඩනැගිය යුතුය. ඒ සඳහා බලවේග එක්රැස් කළ යුතුය. ඒ අතරම සිදුවෙමින් පවතින විනාශය වැළැක්වීමට ද වහාම පියවර ගතයුතුය. ඒ සඳහා පළමු කොන්දේසිය වන්නේ ජනතාවගෙන් සග'වා ඇති සත්‍යය ජනතාවට තේරුම්කර දී අවබෝධ කරවීමය. මෙය මව්බිම වෙනුවෙන් කරන සද්කාර්යයක් ලෙස සලකා, යුතුකමක් ලෙස සලකා ඉටුකළ යුතුය. එබැවින් අපේ ආදරණීය මව්බිම මුහුණදී ඇති මෙම බරපතල අභියෝගයන් පිළිබඳව අප ඉදිරිපත් කළ මෙම කෙටි කරුණු කිහිපය ගැඹුරින් වටහා ගන්නා ලෙසත් ඒ පිළිබඳ සහෝදර ජනතාව දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසත් ඉල්ලා සිටිමු.

